# මේ රැවටිලි දේශපාලනය අවසන් කරනවා

කුච්චවේලි ප්‍රාදේශීය සභා මන්ත්‍රී අපේක්ෂක
**කේ.එම්. සුබෙයිර් (ජෙමිල්)** (ජාජබ)

**ත්‍රිකුණාමලය විශේෂ ඒ.ටී.එම්.ගුණානන්ද අමරජීව**



''දශක තුනක් තිස්සේ පැවති යුද්ධයෙන් දුක් වින්ද කොටසක් තමයි කුච්චවේලි ප්‍රාදේශීය සභාවට අයත් පුල්මුඩේ ප්‍රදේශයේ ඉන්නේ. අඩු අධ්‍යාපනයක් ඇති මේ පිරිස් නූගත් නිසා බලයට පත් සෑම රජයක්ම මේ මිනිස්සු රවට්ටලා ඡන්දය අර ගත්තා. ඒකෙන් මිනිස්සු තව තවත් අසරණ වුණා. දුක් වින්දා. ඒ අය අතර කෙනෙක් තමයි මම. මේ රැවටිලි දේශපාලනය මම අවසන් කරනවා'' යැයි ජාතික ජන බලවේගයේ කුච්චවේලි ප්‍රාදේශීය සභා මන්ත්‍රී අපේක්ෂක කේ.එම්. සුබෙයිර් (ජෙමිල්) මහතා පැවසීය. ඔහු මෙසේ ද පැවසීය.

''බලය ගත් දේශපාලනඥයෝ තමන්ගේ ඥාතීන්ට සැලකුවා. ඉඩම්වලට බලපත්‍ර ගත්තා. ඒ අයගේ ඥාතීන්ට රැකියා දුන්නා. ඡන්දය දීපු මිනිස්සු අදත් එතනමයි. ඒක නිකම් හරියට තමන් පොල්ලක් දීලා තමන්ම ගුටි කෑව වගේ වැඩක්. මම මේ ඡන්දය ඉල්ලන්න හිටියේ නැහැ. මේ යන වැරදි මාර්ගය නිවැරදි කර ජනතාව හරි මාර්ගයට ගන්න කියලා තමයි මම ඉදිරිපත් වෙලා ඉන්නේ. මම මේ වන විට ජරාජීර්ණ දේශපාලනඥයන්ගෙන් බේරෙන්න කියලා ගෙන් ගෙට ගොස් ජනතාව දැනුම්වත් කිරීම ආරම්භ කළා.

ජනතාවගෙන් හොඳ ප්‍රතිචාරයක් මට තියෙනවා. මේ යථාර්ථය පැහැදිළි කර දීම නිසා මම අනිවාර්යෙන්ම කුච්චවේලි ප්‍රාදේශීය සභාවට මගේ කොට්ඨාසය ජයග්‍රහණය කරලා දෙන එක ස්ථිරයි.''

# ලොකු පක්ෂවලට විවේචන වැඩියි

කුරුණෑගල මහ නගර සභා අපේක්ෂක කණ්ඩායම් නායක
**චූලා මෙන්ඩිස්** (ශ්‍රී ලංකා මහජන පක්ෂය)

**කුරුණෑගල අතිරේක පුෂ්පකුමාර ජයරත්න**



මෙවර පළාත් පාලන මැතිවරණයේදී කුරුණෑගල මහ නගර සභාවට ඇතිව තිබෙන තරගකාරිත්වය හමුවේ කිසිදු දේශපාලන පක්ෂයකට සභාවේ බහුතරය දිනාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබෙනවා යැයි කුරුණෑගල මහ නගර සභාවට තරග වදින ශ්‍රී ලංකා මහජන පක්ෂ කණ්ඩායමේ නායක චූලා මෙන්ඩිස් මහතා ප්‍රකාශ කළේය.

ඔහු මෙසේ ද කීය.

"කුරුණෑගල නාගරික සීමාව තුළ පාවිච්චි වෙන්නේ ඡන්ද පහළොස් දහසකට අඩු ප්‍රමාණයක්. ඔය ඡන්ද ටික තමයි කොට්ඨාස දහතුනේම ඉන්න අපේක්ෂකයන් අතරේ බෙදිලා යන්නේ. මේ පාර දේශපාලන පක්ෂ සමඟ ස්වාධීන කණ්ඩායම් දහතුනක් පමණ කුරුණෑගලට තරග කරනවා. මේ නිසා තමන්ට කොට්ඨාසය තුළ ජයග්‍රහණයක් අවශ්‍ය නම් ඒකට ලොකු සටනක් දෙන්න වෙනවා. කුරුණෑගල මහ නගර සභාවේ මන්ත්‍රී ධුර 21ක් තියෙනවා. මෙයින් මන්ත්‍රී ධුර 11ක්ම ගන්න ඕනෑ අවශ්‍ය බහුතරය හදාගන්න නම්. විශේෂයෙන්ම ලොකු පක්ෂ දිහා බැලුවාම සමගි ජන බලවේගයට ගම ඇතුළේ චෝදනා එල්ල වෙනවා ඔවුන් පසුගිය කාලයේදී හැසිරුණු ආකාරය පිළිබඳව. ජනතාව තුළ දැඩි විවේචන එම පක්ෂයට තිබෙනවා. පොදුජන පෙරමුණටත් එහෙමයි. දැන් රටේ ප්‍රධානම දේශපාලන පක්ෂය වන මාලිමාව ගත්තත් මේ පක්ෂයට ඡන්දය දුන්න බොහෝ දෙනකුත් අද කලකිරීමෙන් තමයි ඉන්නේ.

මම අවුරුදු 22ක පමණ දේශපාලන පළපුරුද්දක් තියෙන හිටපු මහජන නියෝජිතයෙක්. මම දේශපාලනයට ආවේ කුරුණෑගල මහ නගර සභාවට මන්ත්‍රීවරයෙකු විදිහටම පත් වීමේ වුවමනාවෙන් නම් නොවෙයි. මම කුරුණෑගල නගරයේ දීර්ඝ කාලයක් ජීවත් වෙන පුරවැසියෙකු විදිහට මටත් වගකීමක් තියෙනවා මේ නගරයට යහපතක් කරන්න."

# රත්නපුර මහ නගර සභාවේ මෙවර පාලනය **සමගි ජන බලවේගය සතු කර ගන්නවා**

රත්නපුර මහ නගර සභා අපේක්ෂක
**බී.ආර්. පාලිත** (සජබ)

**රත්නපුර විශේෂ - එන්.ජී. රාජදොරේ**



''රත්නපුර මහ නගර සභාවට තරග කරන අපේක්ෂක කණ්ඩායමේ මා ඇතුළු හිටපු මන්ත්‍රීවරුන් හත්දෙනෙකු මෙවර තරග කරනවා. අපේ කණ්ඩායම ශක්තිමත් කණ්ඩායමක්. මෙවර රත්නපුර මහ නගර සභාවේ බලය සමගි ජන බලවේගය සතු කර ගන්නවා" යැයි රත්නපුර මහ නගර සභාවේ ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රී අපේක්ෂක බී.ආර්. පාලිත මහතා පවසයි.

ඔහු මෙසේ ද කීය.

''රත්නපුරය කියන්නේ ලෝකයේම වටිනා මැණික්වලට ප්‍රසිද්ධ නගරයක්. නමුත් නගරයේ මැණික් වෙළඳාම් කරන සුළු මැණික් ව්‍යාපාරිකයන් ව්‍යාපාරය කරන්නේ මහ පාරේ. සුළු මැණික් ව්‍යාපාරිකයන්ට මැණික් වෙළඳාමට සුදුසු ස්ථානයක් සකස් කරදුන්නොත් ඒ තුළින් හොඳ ආදායමක් රත්නපුර මහනගර සභාවට ලබා ගත හැකියි. රත්නපුර මහ නගර සභාවට නව ආදායම් ලබාගත හැකි යෝජනා අප සතුව තිබෙනවා. අපි ඒ යෝජනා බලයට පත්වූ වහාම ක්‍රියාත්මක කරනවා. අපේ කණ්ඩායමේ නගරාධිපතිකමට පොරයක් නැහැ. ඉදිරි නගර සභා මැතිවරණයේදී තමන් නියෝජනය කරන කොට්ඨාසය වැඩිම ප්‍රතිශතයකින් ජයගන්නා අපේක්ෂකයා හා නගරය දියුණු කිරීමට නිර්මාණශීලි අදහස් ඇති අවංක අයකු නගරාධිපති ලෙස අපේ සංවිධායකවරයා පත් කරාවි. රත්නපුර මහ නගර සභාව මැතිවරණයට මා පළමුවෙන්ම පිවිසියේ එක්සත් ජාතික පක්ෂයෙන්. දැන් මා සමගි ජන බලවේගය නියෝජනය කරනවා. මා රත්නපුර මහ නගර සභාවේ මන්ත්‍රීවරයෙක්ව සිටියදී සමගිපුර කොට්ඨාසයේ ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා සමිති සමාගම් පිහිටුවමින් කටයුතු කළා. එහි ප්‍රතිඵල අදත් ජනතාව බුක්ති විඳිනවා."

පසුගිය පාලනය නගරයට ආලෝකයක් වුණා

# ඉතිරි වැඩ ටික කරන්න සූදානම්

උකුවෙල ප්‍රාදේශීය සභා අපේක්ෂක
**චේතිය දිසානායක** (පොදුජන එක්සත් පෙරමුණ)

**උකුවෙල සංචාරක - ප්‍රියන්ත සුමනසේන**



බලප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් හැත්තෑතුනම ආවරණය වන පරිදි සංවර්ධන යෝජනා රැසක් සඳහා සැලසුම් සකස් කර ඇතැයි පොදුජන එක්සත් පෙරමුණේ උකුවෙල ප්‍රාදේශීය සභා අපේක්ෂක චේතිය දිසානායක මහතා පවසයි.

ප්‍රදේශයේ පානීය ජල ගැටලු, මංමාවත්, ග්‍රාමීය විදුලි පහන්, නවක තාරුණ්‍යයට දායාදයක් ලෙස ක්‍රීඩාව ගැන දැනුම අවබෝධය ලබාදීම මෙන්ම වංචාවෙන් දූෂණයෙන් තොර ආදර්ශවත් සභාවක් පිහිටු වීමට කටයුතු කිරීම තම එකම අරමුණ බව ද ඔහු කියයි. ඒ මහතා මෙසේද කීය.

''උකුවෙල නගරය මාතලේ නගරය ආසන්නයේ තිබෙන ප්‍රසිද්ධ නගරයක්. පසුගිය අපේ පාලනයේදි උකුවෙල නගරයට ප්‍රබෝධයක් ගෙන දෙන්නට කටයුතු කළා වගේම ඉතිරි වැඩ කොටස් මෙවර පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණයත් සමඟ අංගසම්පූර්ණ නගරයක් බවට පත් කිරීම එකම බලාපොරොත්තුවයි.

උකුවෙල නගරයට අවශ්‍ය පහසුකම් අතර ප්‍රධාන බස් නැවැතුම්පළක්, අත්‍යවශ්‍ය සතොස ආයතනයක්, නගරයට නිසි කානු පද්ධතියක්, සකස් කළා. දැනට මාතලේ ප්‍රදේශය ජනප්‍රියත්වයට පත්ව ඇති යාලේගම ක්‍රීඩාංගණය මේ වන විටත් අංගසම්පූර්ණව සකස් කිරීමට හැකිවුණා.



# ගමේ සටනින් ඇසුණු කතා

# වංචා දූෂණයෙන් තොර සභාවක් හදනවා

## පත්වන සභිකයන්ට කොන්ත්‍රාත් කිරීම තහනම්

රත්තොට ප්‍රාදේශීය සභා
අපේක්ෂක සංවිධායක
**අතුල වික්‍රමනායක** (එජාප)

**උකුවෙල සංචාරක - ප්‍රියන්ත සුමනසේන**



එක්සත් ජාතික පක්ෂ රජයක් යටතේ රත්තොට ප්‍රාදේශීය සභාව වංචාවෙන් දූෂණයෙන් තොර පත්වන සභිකයන්ට කොන්ත්‍රාත් කිරීම සපුරා තහනම් සභාවක් බවට පත්කරන බව රත්තොට ප්‍රාදේශීය සභාවට තරග වදින එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂක කණ්ඩායම් නායක අතුල වික්‍රමනායක මහතා පවසයි.

ඒ මහතා මෙසේ ද කීය.

"රත්තොට ප්‍රාදේශීය සභාව පසුගිය පාලන කාලයේදි විශාල වශයෙන් වංචා දූෂණයෙන් පිරී ඉතිරී ගිය සභාවක් බවට පත්වෙලා තිබුණා. මෙවර පළාත් පාලන මැතිවරණයේදී ගමේ ජනතාව සමඟ සුහදව සාකච්ඡා කරමින් ජනතාවාදි සභාවක් පිහිටුවීම මගේ එකම බලාපොරොත්තුවයි. සිංහල දමිළ මුස්ලිම් බර්ගර් වතු ජනතාවක් සිටින ප්‍රදේශයක් වශයෙන් ඔවුන් විඳින දුර්දුතාවයන් දුක්කරදර අනන්තයි, අප්‍රමාණයි. ඒ වෙනුවෙන් ඔවුන්ගේ ලෙඩට දුකට පිහිට වීමත් ආර්ථිකය ශක්තිමත් කිරීමටත් පවතින සංවර්ධන යෝජනා සියල්ල ශක්තිමත්ව කිරීමත්, සභාවේ ප්‍රතිලාභ ජනතාවට ගලායන ආකාරයට සිදු කිරීමත් මගේ එකම බලාපොරොත්තුවයි."

## රට සහ ජනතාව වෙනුවෙන් සේවය කිරීම **කාලීන අවශ්‍යතාවක්**

කඩුවෙල මහ නගර සභාවේ
**අපේක්ෂිකා සමදරා පනාගොඩ**
(ජානිපෙ)

**මහින්ද අලුත්ගෙදර**



දේශපාලන අවශ්‍යතාව මත මාධ්‍ය සංදර්ශන නොපවත්වා රට සහ ජනතාව වෙනුවෙන් සේවය කිරීම කාලීන අවශ්‍යතාවක් බව ජාතික නිදහස් පෙරමුණෙන් කඩුවෙල මහා නගර සභාව සඳහා පොතුඅරාව කොට්ඨාසයෙන් ඉදිරිපත් වන සමදරා පනාගොඩ මහත්මිය ප්‍රකාශ කරයි.

ඇය මෙසේ ද කීවාය.

ඊමෑත ඉතිහාසය ගත්විට රටක් ලෙස ශ්‍රී ලංකාව අභියෝගයන් රැසකට මුහුණ දුන්නා. කොවිඩ් 19 වසංගත තත්ත්වයෙන් පසුව ආර්ථික අර්බුදයක් පැමිණියා. මේ සියලු තත්ත්වයන්හි දී අපහසුතාවට පත්වුණේ රටේ ජනතාවයි. මේ තත්ත්වය අපි නිවැරැදිව තේරුම් ගත යුතු වෙනවා. නමුත් අද අපිට එවැනි තත්ත්වයක් දකින්න ලැබෙන්නේ නැහැ. රටේ සහ ජනතාවගේ අවශ්‍යතාව කුමක් වුවත් අද බහුතරයක් කරන්නේ පරණ න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරමින් බලයේ රැඳී සිටීමට උත්සාහ කිරීමයි. මේ තත්ත්වය වෙනස් කළ යුතු වෙනවා. ඒ නිසා මෙවර පළාත් පාලන මැතිවරණයේ දී ජාතික නිදහස් පෙරමුණට ඡන්දය දෙන්න කියා අපි ඉල්ලනවා. අපි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් පිළිබඳව හොඳ අවබෝධයකින් පසුවෙනවා. කඩුවෙල මහ නගර සභාව තුළ නව ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා නව ව්‍යාපෘති හඳුන්වා දෙනවා. අපනයන වෙළෙඳපොළට අවතීර්ණ වීම සඳහා නව අවස්ථාවන් සම්පාදනය කරනවා. කාන්තා නීති සම්පාදනය කරනවා. ඒ වගේම කඩුවෙල මහ නගර සභා බලප්‍රදේශය තුළ සංචාරක ව්‍යාපාරය දිරි ගන්වන්න බලාපොරොත්තු වෙනවා.ෆ

# කුස්සියේ මුල්ලට හිරවූ කාන්තාව සවිබල ගන්වනවා

අම්බලන්ගොඩ නගර සභා අපේක්ෂිකා
**ඉන්ද්‍රා අයිරාංගනී** (එජාප)

**අහුන්ගල්ල සමූහ - අනුර යසමිත්**



"කුස්සියේ මුල්ලට හිර වී සිටි කාන්තාවන් සවිබල ගන්වා රටේ සංවර්ධනයට යොමු කර ගැනීම සඳහා හඬක් නැඟීමට මෙවර මැතිවරණයට ඉදිරිපත් වුණා" යැයි අම්බලන්ගොඩ නගර සභා එක්සත් ජාතික පක්ෂ අපේක්ෂිකා ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය පවසන්නීය.

ඇය මෙසේ ද කීවාය.

''මගේ ප්‍රධාන අරමුණ කාන්තාවන් වෙනුවෙන් වැඩ කිරීමටයි. අද රටේ හැම ප්‍රශ්නයකටම මුහුණ දෙන්න සිදු වී තිබෙන්නේ කාන්තාවන්ටයි. මහජන නියෝජිතවරියක් ලෙස අම්බලන්ගොඩ නගර සභාවේ කාන්තා කමිටු ස්ථාපිත කර තිබෙනවා. ඒ තුළින් අසරණ කාන්තාවන්ට නීති ආධාර, පොලීසියේ ආරක්ෂාව, උපදෙස් ආදිය මෙන්ම නොයෙකුත් ආධාර උපකාර කරනවා. එමෙන්ම කාන්තාවන්ගේ තොරතුරු රැස් කිරීම කරනවා. මම විශේෂයෙන්ම මේ මැතිවරණයට ඉදිරිපත් වුණේ කාන්තාවන් සවිබල ගැන්වීමටයි. රැල්ලට රැල්ලට කියල එක එක මැතිවරණවලදී එක එක පක්ෂවලට ඡන්දය දිය යුතු නැහැ. බුද්ධිමත්ව වැඩ කරන්න පුළුවන් පිරිසක් පත්කර ගත යුතුයි. අම්බලන්ගොඩ නගරය උගත් බුද්ධිමතුන්ගෙන් පිරි නගරයක් ලෙසටයි ප්‍රකට වී තිබෙන්නේ. ඒ නිසා නගර සභාවටත් උගත් බුද්ධිමත් පිරිසක් පත් කිරීම ජනතාවගේ යුතුකමයි. නැත්නම් එන එන රැලිවලට ඡන්දය දෙන්න ගියොත් රැල්ලට ගහගෙන යන්න ඉඩ තිබෙනවා. අපේ රටේ සියයට පනස් දෙකක් ඉන්නේ කාන්තාවෝ. ඉන් සියයට පනස් හයක් කාන්තාවෝ ඡන්දය දෙනවා. කාන්තාවන්ට රටේ පාලනය භාර දිය යුතුයි කියල හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්තයා සියයට විසි පහක් කාන්තා නියෝජනය තිබිය යුතු නීතිය එකතු කළේ.

# ගමේ සංවර්ධනයට ලැබෙන මුදලින් **සත පහක්වත් අපතේ යවන්නේ නෑ**

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා
**අපේක්ෂක - අමිල රාජපක්ෂ** (ජාජබ)

**කොළොන්නාව සමූහ - ඒ. සුමනසේන**



ඊගමේ සංවර්ධනය සඳහා ලැබෙන මුදලින් ශත පහක් වත් අපතේ නොයවා බදු ගෙවන ජනතාවගෙන් වතුර උගුරක්වත් ලබා නොගෙන ඇප කැපවී වැඩ කරන අපේක්ෂක කණ්ඩායමක් අපට ඉන්නවාෆ යැයි කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව සඳහා ජාතික ජන බලවේගයේ අපේක්ෂක අමිල රාජපක්ෂ පවසයි.

ඔහු මෙසේ ද පැවසීය.

ඊපසුගිය කාලයේදී අපේ ප්‍රාදේශීය සභාවෙන් ප්ලෑනක් පාස් කරගන්න රාජකාරි කටයුත්තක් කර ගන්න ගියාම අත යටින් මුදලක් ගෙවීමට ජනතාවට සිදු වෙලා තිබුණේ. ජනතාවට කිසිම දෙයක් නිසි ක්‍රමවේදයට අනුව කරගන්න සභාවෙන් ඉඩක් තිබුණේ නෑ. ඒ තරම්ම දූෂිතයි. ඒ දූෂිත ක්‍රමවේදය අයින් කරලා පිරිසුදු පාලනයක් අපි ප්‍රාදේශීය සභාව තුළ ඇති කරනවා. ඒ නිසා අපි පාර්ලිමේන්තුව සුද්ධ කරලා මාලිමාවෙන් පිරෙව්වා වගේ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවත් මාලිමාවෙන් පුරවන්න කියලා මම ඉල්ලනවා.ෆ

# අබලන්වී ඇති මාර්ගය **නිසි ප්‍රතිසංස්කරණයකට යොමුකරනවා**

ගල්කිස්ස මහ නගර සභා අපේක්ෂක
**නවරත්න වන්නිආරච්චි**
(සර්වජන බලය)

**දෙහිවල සමූහ - ඩී.පී.හේරත්**



දහසක් බලාපොරොත්තු පොදි බැඳගෙන වත්මන් රජය බලයට පත් කළ ජනතාව මේ වනවිට කළ මෝඩකම් තේරුම් අරගෙන පසුතැවෙමින් සිටින බවත්, එය නිවැරදි කිරීම සඳහා මෙවර පළාත් පාලන මැතිවරණය ප්‍රයෝජනයට ගන්නා ලෙසත් ගල්කිස්ස මහ නගර සභාවට තරග කරන සර්වජන බලය පක්ෂයේ අපේක්ෂක නවරත්න වන්නිආරච්චි මහතා පවසයි.

ඔහු මෙසේ ද පැවසීය.

"දෙහිවල- ගල්කිස්ස පුරවරය ලෝක ප්‍රසිද්ධ සංචාරක පුරවරයක්. ඒ නිසාම නගර සභාවක් ලෙස පරිසරය අලංකාර කරලීම, ජනතා සනීපාරක්ෂක පහසුකම් සියල්ල වැඩි දියුණු කරලීම පැවරී තිබෙනවා. ඒ අනුව මා මේ සඳහා රත්මලාන නැඟෙනහිර කොට්ඨාස අපේක්ෂක ලෙස භෞතික, ආර්ථික, සමාජයීය, ආගමික මෙන්ම සංස්කෘතික වශයෙන් සැලසුම් රාශියක් සකසාගෙන තිබෙනවා. ඒ සඳහා යන ගමනේදී මා නිවේදක ශිල්පියෙකු ලෙසත්, ගුවන් විදුලි නාට්‍ය ශිල්පියෙකු, ප්‍රසංග නිවේදන ශිල්පියෙකු වශයෙන් කටයුතු කිරීමේදී ලබාගත් අත්දැකීම් හා ප්‍රභූවරයන්ගේ අදහස් පවා ලබාගෙන නගර සභා පරිපාලනය තුළින් ගමට සහන සේවා සැලසීමට කටයුතු කරනු ලබනවා. ඒ අනුව මා නියෝජනය කරන රත්මලාන නැඟෙනහිර කොට්ඨාසයට අයත් කොතලාවලපුර, බංගලාව පාර මේ වනවිට රෝගියකු පවා ගෙනයා නොහැකි ලෙස අබලන්වී ඇති මාර්ගය නිසි ප්‍රතිසංස්කරණයකට යොමු කරනු ලබනවා. මේ සඳහා මූලිකව දුම්රිය දෙපාර්තමේන්තුව පාලනාධිකාරිය සමඟ සාකච්ඡා පවත්වනු ලබනවා. එබැවින් මෙවර අනිවාර්යයෙන්ම දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවට මා මෙම කොට්ඨාසයේ අපේක්ෂකයා පත්කර හරින ලෙසත් ඉල්ලා සිටිනවා."

# කොට්ඨාසයේ තිබෙන ගැටලු ගැන හොඳින් දන්නවා

විසඳුම් දුන්නා: තව දෙන්න තියෙනවා

කන්තලේ ප්‍රාදේශීය සභා අපේක්ෂක
**ඒ.සී.එම්. ජවාහිර්** (ජාතික කොංග්‍රසය)

**ත්‍රිකුණාමලය විශේෂ - ඒ.ටී.එම්. ගුණානන්ද අමරජීව**



"මම කන්තලේ ප්‍රාදේශීය සභාවට ඉල්ලන්නේ දෙවැනි වරට. පළමු සැරේ දිනලා මන්ත්‍රීවරයෙක් විදිහට විශාල වැඩ කොටසක් කළා. ඒ වැඩ කොටස ඇමැති කෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් නොකළ වැඩ කොටසක්" යැයි කන්තලේ ප්‍රාදේශීය සභා ජාතික කොංග්‍රස් මන්ත්‍රී ධුර අපේක්ෂක ඒ.සී.එම්.ජවාහිර් මහතා පැවසීය.

ඔහු මෙසේ ද පැවසීය.

''මම මන්ත්‍රී වෙලා ඉන්න කාලේ රාජ්‍ය නොවන සංවිධාන හරහා ජනතාවට ස්වයං රැකියා ආරම්භ කරන්න ඔරු දුන්නා. පාපැදි දුන්නා. මහන මැෂින් දුන්නා. ස්වයං රැකියා ආධාර දුන්නා. ඒ නිසා ජනතාවට මං ගැන පැහැදිල ඉන්නේ. සමගි ජන බලවේගයෙන් මට නාමයෝජනා දෙනවා කියල මට අඬ ගැහැව්වා. නාමයෝජනා දෙනදාට කලින් දින මට ඒ අය පොල්ල තිබ්බා. ඒ මොකද දන්නවද මගේ ජයග්‍රහණය ස්ථිර නිසා. ඒ කියන්නේ 100% මම දිනනවා. මගේ ජයග්‍රහණයෙන් පසුව පොදු ජනතාව සමඟ වැඩ කරනවා. දුප්පත් ළමයින්ට පාසල් උපකරණ අරන් දෙනවා. මම තරග කරන පේරාරු නැඟෙනහිර කොට්ඨාසය යළි දියුණු කිරීම මගේ ජයග්‍රහණයත් සමඟ සිදුවෙනවා. මොකද කොට්ඨාසයේ තිබෙන ගැටලු පිළිබඳ අවබෝධයක් හා දැනීමක් මට තියෙන නිසා. ඒවාට මීට කලින් මම විසඳුම් දීලා තියෙනවා. සමහර ඒවට විසඳුම් දෙන්න තියෙනවා. ඒක ජනතාව දන්නවා.

# ගමේ ජනතාවගේ ගැටලු හමුවේ එදත් අදත් ඔවුන් සමඟ සිටිනවා

බද්දේගම ප්‍රාදේශීය සභා අපේක්ෂක
**අජිත් ප්‍රේමකුමාර** (සර්වජන බලය )

**බද්දේගම මධ්‍යම විශේෂ - ජස්ටින් පතිරගේ**



'බද්දේගම ජනතාවගේ සුබසිද්ධිය උදෙසා මා කටයුතු කළා. ඉදිරියටත් ඔවුන් වෙනුවෙන් සේවය කිරීම මගේ එකම අරමුණ' යැයි බද්දේගම ප්‍රාදේශීය සභා සර්වජන බලයේ අපේක්ෂක අජිත් ප්‍රේමකුමාර මහතා පවසයි.

ඔහු මෙසේ ද පැවසීය.

''මගේ මූලික අරමුණ වූයේ දේශපාලනයට පිවිසීමයි. එය ඉටු වුණේ 2018 පළාත් පාලන මැතිවරණයේදී එ.ජා.පෙ. කෙසෙල් ඇවරිය ලකුණින් තරග කරලා පක්ෂයේ එකම අපේක්ෂකයා ලෙස තේරී පත්වුණා. ඒ කාලසීමාව තුළ මම ගමේ ජනතාවගේ ප්‍රශ්න ගැටලු ඉටු කරන්නට සෑම කටයුත්තක්ම කළා. සංවර්ධන යෝජනා ඉටුකළා. රැකියා ලබා දුන්නා. 2025 පළාත් පාලන මැතිවරණයට සභිකයකු වශයෙන් ඉදිරිපත්වුණේ සර්වජන බලය පක්ෂය වෙනුවෙන්. පසුගිය වකවානුවේදී කරන ලද වැඩපිළිවෙළ තවදුරටත් ඉදිරියට කරගෙන යන්න මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම බද්දේගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ සංවර්ධන වැඩපිළිවෙළ තවදුරටත් මට කළ හැකි උපරිම අයුරින් ඉටු කිරීමට මා උත්සාහ කරනවා. කණ්ඩායම් නායකයා ලෙස මම පක්ෂයේ සියලු දෙනාගේම ජයග්‍රහණය සඳහා කැපවීමෙන් කටයුතු කරනවා. තරුණ තරුණියන්ගේ රැකියා සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා පිහිටක් වීම, ආදිය ඉටුකිරීමට බලාපොරාත්තු වෙනවා. මංමාවත් හැදුවා, බද්දේගම ක්‍රිස්තුදේව පිරිමි විදුහලේ ක්‍රීඩාපිටිය, රතනසාර මහ විදුහලේ ක්‍රීඩාපිටිය, මාපුවාන කනිෂ්ඨ විදුහලේ ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම සඳහා මෙන්ම ස්වේච්ඡා සමිති සඳහා එයට අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දුන්නා."